ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021.11.26

පොලිස්පති,

පොලිස් මූලස්ථානය,

කොළඹ 01

<u>**පැමිණිලි අංක : එච්.ආර්.සි/2706/21**</u>

<u>**හේවාලුනුවිලගේ ලසන්ත නොහොත් ටින්කර් ලසන්ත යන අයගේ පවුලේ ඥාතීන්ගේ ආරක්ෂාව සම්බන්ධවයි.**</u>

හේවාලුනුවිලගේ ලසන්ත නොහොත් ටින්කර් ලසන්ත යන අය කළුතර කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය මගින් 2021.11.25 වන දින අත්අඩංගුවට ගත් බවත් ඒ සමඟ ඔහුගේ බිරිද සහ දියණියද පොලිස් අත්අඩංගුවට ගෙන ඇති බවට නීතිඥ සංජය ආරියදාස මහතා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2021.11.25 වන දින දැනුවත් කර ඇත.

2021.11.26 වන දින කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායමක් එම පවුලේ සමාජිකයින් පිළිබඳව කළුතර කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකයෙන් විමසීම් කළද ඔවුන් අත්අඩංගුවට නොගත් බවත් ප්‍රකාශ කර ඇත. එහෙත් 2021.11.26 වන දින පෙ.ව 7.30 ට පමණ ඔවුන් දෙදෙනා කළුතර කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය වෙත පැමිණි බවත් පොලිස් නිලධාරීන් විසින් ඔවුන් රෝහල වෙත ගෙන යාමට කටයුතු සකස් කරන විට ඔවුන් එම ස්ථානයෙන් බැහැරව ගොස් ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ට පොලිස් නිලධාරීන් විසින් දැනුම් දී ඇත. තවද ඔවුන් පදිංචි බවට තහවුරු වු නිවෙස් වලද ඔවුන් කිසිවෙකු නොමැති බව නිරීක්ෂණය වී ඇත.

ඒ අනුව හේවාලුනුවිලගේ ලසන්ත නොහොත් ටින්කර් ලසන්ත යන අයගේ බිරිද සහ දියණියගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන 2021.11.30 දිනට පෙර ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 (අ), (ඇ), (උ) වන වගන්තිය අනුව බව සලකන්න.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ලේකම්, (වැ.බ)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk